

# ක හරිස්චන්ද්‍ර අනුස්මරණ සාහිත්‍ය සම්මානය

## ඔස්ට්‍රේලියාවේ සිංහල පත්තර කලාවේ පුරෝගාමියා ජගත් ට

පෙබරවාරි 4 වන දින බොක්ස්හිල් නගර ශාලාවේ පැවති ශ්‍රී ලංකා නිදහස් දින උළෙලේ දී ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන් කළ අතිමහත් සේවාව අගයමින් සන්නස උපදේශක සංස්කාරක ජගත් ජේ එදිරිසිංහ සොහොයුරා ක. හරිස්චන්ද්‍ර අනුස්මරණ සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලදදේ ය. සම්මාන හෝ වෙනයම් ලාබ ප්‍රයෝජන පසුපස හඹා නොගොස් නිහඬව තම සේවාව කරගෙන යන ජගත් ට මෙම සම්මානය පිදීම පමා වී හෝ ගත් ඉතා නිවැරදි පියවරකි. ඒ පිළිබඳව මෙල්බන්හි ශ්‍රී ලංකා කොන්සල් බන්දු දිසානායක මහතාට ශ්‍රී ලාංකේය සමාජයේ ප්‍රශංසාව හිමිවනු නියතය.

කුඩා කල සිටම සිංහල සාහිත්‍යයට කැපවුණ ජගත් ගේ සේවාව මෙල්බන් වාසී ශ්‍රී ලාංකිකයනට ලැබෙන්නේ මෙයට වසර 10 කට පමණ පෙර සෙරෙන්ඩිබ් නිව්ස් ඉංග්‍රීසි පුවත්පතේ සිංහල පිටු සංස්කරණය ආරම්භ කිරීමත් සමගය. ඒ කුඩා ඉඩ කඩ හරහා ජගත් සාහිත්‍ය ක්ෂෙත්‍රයට කැන්දාගෙන ආ - හඳුන්වාදුන් - ලේඛක ලේඛිකාවන් රැස ජගත්ගේ සේවාව සදා අගයනු ඇති බව නිසැකය.

3zzz ගුවන් විදුලියේ සංවත්සර උත්සවයක් වෙනුවෙන් පැවැත් වූ සාහිත්‍ය තරගයක ජයග්‍රාහක ජයග්‍රාහිකාවනට සහතික පත් බෙදා දීමට ජගත්ට ආරාධනාවක් ලැබුණි. ජගත් අතින් සහතිකපත ගන්නා අතර එක් ජයග්‍රාහිකාවක වේදිකාව මතදීම ජගත්ට කී දෙයක් ජගත් අප සමග කීවේ සතුටු කඳුළින් ඇස් පුරවාගෙනය.

"අයියේ මේ සම්මානය මට අද ලැබෙන්නෙ ඔයා පහන සන්නස සඟරා වලට ලියන්න අපව පොළඹවපු නිසයි. අපිව දිරිමත් කළ නිසයි. ඒක අපට කවදාවත් අමතක වෙන්නෙ නැහැ"

පසු කාලයක සෙරෙන්ඩිබ් නිව්ස් පුවත්පතෙන් ඉවත් වන ජගත් වරුණ සාවින්ද සමගින් පහන සඟරාව ආරම්භ කළේ ය. ඒ 2003 වසරේදීය. යම් යම් හේතු මත පහනේ අයිතිය වෙනස් වූ විට ජගත් සන්නස පුවත්පත ආරම්භ කළේ ය. ඒ සාලිය ගලප්පත්ති හා අපත් සමගය. මට පළමු වතාවට ජගත් හමුවන්නේ මෙයට වසර හයකට පෙර සන්නස ආරම්භ කිරීම සඳහා ජගත් පොළඹවා ගන්නට ඔහුගේ නිවසට ගිය අවස්ථාවේදී ය. පළමු හමුවීමේදීම ජගත් මගේ සිත් ගත්තේ ය. ඔහුගේ නිර්ව්‍යාජ කතා බහට මම කැමති වීමි.

ජගත් ඉතා නිහතමානී සුන්දර මිනිසෙකි. ඔහු ළඟින් ඇසුරු කරන අපි එය දනිමු. ඔහු කෙළින් කතා කරයි. කිව යුත්ත කෙළින් කියයි. සමහරුන-ට එය දිරවා ගන්නට නොහැකි බව අපි දනිමු. ලාබ ප්‍රයෝජන සඳහා හෝ මිනිසුන් ඇන්දවීමේ කලාව ජගත් හඳුනන්නේ නැත. කෙතරම් පාඩු වුව ද ඔහු වරද දුටු තැන පෙන්වා දෙයි. ඒ හිතේ කිසිදු කහටක් නැතිවය. යමක් නිවැරදිව සිදුවනු දකින්නට ඔහුගේ සිතේ ඇති කැමැත්ත නිසා ය.

ඩී බී කුරුප්පු මහතා ජගත්ගේ අති මහත් ගෞරවයට පාත්‍ර වූ ප්‍රවීණ ලේඛකයකු බව අපි දනිමු. එතුමාගේ පොතක් පිළිබඳව ජගත් කළ දැඩි විචාරයක් පිළිබඳව කුරුප්පු මහතා සිය ස්වයං ලිඛිත චරිතාපදානය වන "හැන්දෑවට පායන හිරු" කෘතියේ විස්තර කර තිබෙයි. හිතවතුන් සැනසීම හෝ පිනවීම සඳහා බොරු වර්ණනා ඇද බෑමේ පුරුද්දක් ජගත්ට නැත.

ජගත්ගේ සාහිත්‍ය ගමන ආරම්භ වන්නේ ඔහු කුඩා කාලයේදීමය. ඔහු විවිධ පුවත්පත් සඟරා ඔස්සේ සිය හැකියාවන් ප්‍රදර්ශනය කළේ ය. මිහිර නවයුගය විජය වැනි පවත්පත් හා අධ්‍යාපන දෙපාර්තමේන්තුව ප්‍රකාශයට පත්කළ නුවන මාසික සඟරාව ඔස්සේ පිය නැගූ ජගත් ක්‍රමයෙන් දිවයින ලක්බිම හා රාවය වැනි ජාතික පුවත්පත් සිය නිර්මාණ වලින් සැරසුවේය.

ඔහුගේ පළමු මුද්‍රිත පොත "කන්ද උඩ මාලිගාව" කෙටිකතා සංග්‍රහයයි. ඒ 1999 දීය. වසර 2000 දී


අසෝක සුබසිංහ
සංස්කාරක
සන්නස


ඔහු "සිසිරයේ පිපුණ මල" නමින් සිය පළමු කාව්‍ය සංග්‍රහය එළි දැක්වූයේය. අන්තර්ජාලයට පියවර නමින් තාක්ෂණ ග්‍රන්ථයක් ජගත් අතින් බිහිවූයේ 2003 වසරේදී ය. ඉන්පසුව "අසුර අඩවිය" (2007) සහ ගිම්හාන සුළඟ" (2008) නවකතා ඔහු අතින් බිහිවිය. 2010 වසරේ දී ඔහු "තාරකා විජිතය" නවකතාවත් "ඉස්කෝලෙ කාලෙ" යොවුන් නවකතාවත් "රාජාලි පියාපත" කාව්‍ය සංග්‍රහයත් එකවර එළිදැක්වූයේ ය. ඒ සමගින්ම ඔහුගේ ගී පද රචනා ඇතුළත් " හුදකලා මිනිසා" සංගත තැටියද එළිදැක්වූයේය.

ප්‍රථම වතාවට සිංහල සාහිත්‍ය වෙබ් අඩවියක් අන්තර්ජාලයට එක්කළේ ද ජගත් ය. ඒ මෙයට වසර 10 කට පෙර දී අන්තර්ජාලයට එක් කළ කැටපත් පවුර www.ketapathpawra.com සිංහල සාහිත්‍ය සංග්‍රහයයි. පසුගිය වසරේ දී ජගත්ගේ පොත් තුනක් එළි දැක්වීම වෙනුවෙන් කොළඹ 7 ජාතික පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේ පැවති උත්සවයේ දී ප්‍රවීණ ලේඛක විචාරක කේ කේ සමන් කුමාර මහතා කීවේ සිංහල සාහිත්‍යය වෙනුවෙන් කැපවුණ පළමු සිංහල වෙබ් අඩවිය දියත් කළ මිනිසා ලෙස ජගත් ගේ නම ඉතිහාස ගත වන බවයි.

ජගත් මා දුටු අපූරුම මිනිසෙකි. ඔහු වරලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකි. එංගලන්තයේ යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේත් ඔස්ට්‍රේලියාවේ ඉංජිනේරු ආයතනයේත් ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනයේත් පූර්ණ සාමාජිකත්වය හා වරලත් ඉංජිනේරු පිළිගැනීම ලද ජගත් ශ්‍රී ලංකාවේ ලංකාවේ මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරුවරයකු ලෙස 1998 දක්වා සේවය කළේ ය. අනතුරුව ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වන ඔහු ඔස්ට්‍රේලියාවේ ස්වින්බර්න් විශ්වවිද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිලිබඳ විද්‍යාපති (MSc) උපාධියක්ද ලබා ගත්තේ ය. ඔස්ටේලියා රජයේ සීඑස්අයිආර්ඕ ආයතනයේ පරිගණක ක්‍රමලේඛකයකු ලෙසද කලක් සේවය කළේ ය. මේ තාක්ෂණික මිනිසා ලේඛකයෙකි පුවත්පත් කලාවේදියෙකි කවියෙකි චිත්‍ර ශිල්පියෙකි ගීත රචකයෙකි ගී තනු නිර්මාපකයෙකි නිවේදකයෙකි ගුවන් විදුලි ශිල්පියෙකි. ඒ සියල්ල අතරේ ඔහු නිහඬව ලෝකය දෙස බලා සිටිනා රසවතෙකි. ඉතා සරළ හදක් ඇති මිනිසෙකි.

ඔහු 3zzz ගුවන් විදුලියේ සිංහල කමිටුවේ ලේකම් ධුරය දරමින් "අන්තර්ජාලයට නිමේෂයක්" "බස දෙස ඇස" "යාත්‍රා" වැනි වටිනා වැඩසටහන් ඉදිරිපත් කළේ ය. ශ්‍රීනාත් මද්දුමගේ සමගින් එක් වී "අපේ කතා" සහ "බෝගහ හන්දිය" වැනි ජනප්‍රිය ගුවන් විදුලි නාට්‍ය ඉදිරිපත් කළේ ය. ඔහු පවන ගුවන් විදුලිය ආරම්භ කරන්නට උර දුන්නේ ය. ඉන්පසු ශ්‍රීනාත් මද්දුමගේ හා දසුන් ගජමන් සමගින් එක් වී තිසර ගුවන් විදුලිය ආරම්භ කළේ ය. (මේ ගුවන් විදුලිය අද නම වෙනස් කර පවත්වාගෙන ගියත් ඉතිහාසය කිසි දිනෙක මකන්-නට හෝ වසංගන්නට නොහැකිය)

ඔහුගේ මුලු ඔස්ට්‍රේලියානු දිවියම කැපවුණේ සිංහල පත්තර සහ ජනමාධ්‍ය වෙනුවෙනි. "පහන" පුවත්පත ගොඩනගන්නට ඔහු දිවා රෑ වෙහෙසුණේය. දවස් ගණන් නිවසින් පිටව සිටියේ ය. අතේ තිබූ තුට්ටු දෙකත් පත්තර ගහන්නට වියදම් කළේ ය. ඒ අධික කැපවීම ඔහුගේ පුද්ගලික දිවියේ බොහෝ දේ ඔහුට අහිමි කළේ ය. සමාජයට තමාගෙන් වන මෙහෙය වෙනුවෙන් ඒ සියල්ල නිහඬව විඳදරා ගන්නට ඔහුට හැකි විය.

මේ රටේ ජීවත්වන ශ්‍රී ලාංකිකයන් අතරින් සමාජ සේවයේ යෙදන්නන් සියල්ලන්ම පාහේ එසේ කරන්නේ තමන්ගේ පුද්ගලික දිවිය ස්ථාවර කර ගැනීමෙන් පසුවය. ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික සමාජයට සිංහල පත්තර ගෙන ආ මේ මිනිසා හරි හම්බ කරගත් දෙයක් නැත. ඔහුටය කියා කිසිදු නිශ්චල දේපළක් නැති බව මම දනිමි.

"මං හම්බ කළේ මට ආදරේ කරන මිනිස්සු විතරයි.." ඔහු වරක් මා සමග කීවේය. කිසිදු පසුතැවීමක් නොපෙන්වන ඔහු සැහැල්ලුවෙන් සිනාසෙමින් සිටියි. මේ සමාජයේ බොහෝ දෙනා ඔහුට ආදරය කරන්නේ ඔහුගේ මේ නිහතමානී බව නිසා යයි මට සිතෙයි.

"ඇයි අතින් වියදම් කරගෙන සන්නස කරගෙන යන්නෙ?" වරක් කිසිවකු ඔහුගෙන් ඇසුවේ ය. "නවත්තන්න බැහැ.. මිනිස්සු පත්තරේ කියවන්න බලාගෙන ඉන්නවා.. අපි කොහොම හරි මේක ගෙනියන්න ඕනෙ" ජගත් කීවේ ය. පත්තර වෙනුවෙන් ජගත් ගේ කැපවීම ඒ තරම් ප්‍රබලය.

"මේ රටේ සිංහල ගුවන්විදුලි ක්ෂේත්‍රයට මේ මනුස්සයගෙ හැකියාවෙන් හා දැනුමෙන් විශාල ප්‍රයෝජනයක් ගන්න පුලුවන්.. ඒත් අවාසනාවට සමහර මිනිසුන් නිසා සමාජයට ඒ අවස්ථාව නොලැබී ගිහින් තියෙනවා" ජගත් ගැන කතා කරමින් සිටියදී සන්නස සහය සංස්කාරක ශ්‍රීනාත් මද්දුමගේ වරක් කී සැටි මට මතක ය. විද්‍යාව තාක්ෂණය සාහිත්‍යය ගීතය සිනමාව වේදිකා නාට්‍යය ආදී ඕනෑම විෂයයක් සම්බන්ධයෙන් ඔහුගේ දැනුම අති විශාලය. මේ ඕනෑම විෂයයක් යටතේ පැය ගණනක් හෝ එක දිගට කතා කරන්නට ඔහුට හැකි බව අපි දනිමු. මෙරට ජනමාධ්‍ය වලට අරක් ගෙන සිටින මෙලෝ හසරක දැනුමක් නැති පුහු මිනිසුන් දකින විට ඔවුන්ගේ පුහු කතා අසන විට අපට දුක සිතෙන්නේ එනිසා ය.

වසර කීපයකට පෙර ජගත් සන්නස අපට බාර දුන්නේ ය. හොඳ මිලකට සන්නස විකුණා ගත හැකිව තිබුණද ඔහු එසේ නොකළේ ය. "දරු-වෙක් විකුණගෙන කන්න බැහැ.. ඒත් මට දැන් නිදහසේ මගේ ලේඛණ වැඩ කරගෙන යන්න ඕනෙ.. සන්නසත් එක්ක මට ඒකට නිදහසක් ලැබෙන්නෙ නැහැ.. ඒ නිසා සන්නස බාරගෙන දිගටම කරගෙන යන්න.." ඔහු මට කීවේ ය. ජගත් නැති සන්නසක් ගැන මට සිතන්නට නොහැකි ය. මා කොයි තරම් පෙරැත්ත කළ ද ඔහු සිය අදහස වෙනස් නොකළේ ය. අවසා-නයේදී සන්නසේ උපදේශක සංස්කාරක තනතුර බාර ගෙන අප සමග සිටින්නැයි මම ඉල්ලා සිටියෙමි. ඔහු එකඟ විය. මම සන්නසේ සංස්ක-ාරක ධුරය බාරගතිමි. එහෙත් අදත් ජගත් සන්නස වෙනුවෙන් දිවා රෑ වෙහෙසෙයි. ඔහුගේ කුලී කාමරයේ විදුලි පහන් නිවෙන්නේ රෑ තුන් තිස් පැයක් ගිය පසුව ය. කලාව ඔහුගේ ජීවිතය බව මම දනිමි. ජගත් නැති සිංහල පත්තර කලාවක් ඔස්ට්‍රේලියාවේ පැවතිය නොහැකි ය.

මිනිසකු අපට අහිමි වූ පසු ඔහු සමාජයට කළ සේවය ගැන කතා කිරීමෙන් ඇති ඵලය කුමක්ද? කතා කළ යුත්තේ අගැයිය යුත්තේ ඒ මිනිසා ජීවත්ව සිටියදී ය. ඒ අර්ථයෙන් මෙල්බන් කො-න්සල් බන්දු දිසානායක මහතා ප්‍රමුඛ සංවිධායක මණ්ඩලය ජගත් මේ සම්මානය සඳහා තෝරා ගැනීම අපේ අති මහත් සතුටට හේතු වෙයි. එය පමා වී හෝ ගත් නිවැරදි පියවරකි. මේ ලිපිය ලීවේ මගේ හිතේ ඇති වූ ඒ සතුට වෙනුවෙනි. මේ මිනිසාට ආදරය කරන දහස් ගණන් මිනිසුන් වෙනුවෙනි.